PMoE Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்ரகமுவமாகாணசபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்விதகவல்தொழில்நுட்பம்மற்றும்கலாச்சாரநடவடிக்கைகளுக்கானஅமைச்சு

Ministry of Education, Information Technology & Cultural Affairs

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary } Office – 045 2223015

කාර්යාලය / Office } නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number } ME/E/05/01/02

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date } 2024.04.16

……………………. මයා/මිය/මෙය,

…………………….,

…………………….,

…………………….

| | | |
|---|---|---|
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය : | | |
| සම්මුඛ පරීක්ෂණ අංකය : | | |
| විෂය හා විෂය අංකය : | | |

**<u>සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් (සිංහල/ දෙමළ මාධ්‍යය) බඳවා ගැනීම - 2023.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් පළ කරන ලද 2023.10.13 දිනැති ගැසට් නිවේදනය අනුව, ඔබ විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අයදුම්පත්‍රය අනුව ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය හා ඊට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය **2024.04.25 හා 26 යන දෙදින රත්නපුර, නව නගරයේ පිහිටි සබරගමුව පළාත් සභා ශ්‍රවණාගාරයේදී පෙ.ව. 9.00** සිට පැවැත්වේ.

02. මෙම බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවන ලද 2023.10.13 දිනැති ගැසට් නිවේදනයේ 3.6 යටතේ සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම සිදු කරන බැවින්, ඔබ විසින් සුදුසුකම් ලැබූ විෂයට අදාළව තෝරා ගන්නා ලද මාතෘකාවක් ඔස්සේ විනාඩි 05ක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම්ව පැමිණිය යුතුය. (ඔබගේ ඉදිරිපත් කිරීම සඳහා White Board, White Board Pens හා කර්ණාටක සංගීතය විෂය සඳහා හාමෝනියම් වාද්‍ය භාණ්ඩය සපයනු ලබයි.) දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා අයදුම් කළ සියලුම අයදුම්කරුවන් තම ඉදිරිපත් කිරීම දෙමළ මාධ්‍යයෙන් සිදු කළ යුතුය.

03. ඒ අනුව, පහත සඳහන් ලේඛනවල මුල් පිටපත් හා ඒවායේ ඡායා පිටපත්ද ( එම ඡායා පිටපත් සත්‍ය පිටපත් බවට ඔබ විසින්ම සහතික කර ඉදිරිපත් කළ යුතුය) සමඟ නියමිත දින මෙම පරීක්ෂණයට පෙනී සිටින ලෙස මෙයින් ඔබට දන්වා සිටිමි.

I. පහත 04 ඡේදයේ සඳහන් පරිදි සම්පූර්ණ කරන ලද දිවුරුම් ප්‍රකාශය (ආකෘතිය අමුණා ඇත).
II. උප්පැන්න සහතිකය **(නොමිලේ නිකුත් කරන ලද සහතිකය හැර).**
III. ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
IV. ග්‍රාම නිලධාරී සහතිකය (DS 04) (ඔබ අයදුම්කරනු ලැබුවේ කාලත්‍රයාගේ පදිංචිය මත නම්, කාලත්‍රයාගේ පදිංචිය තහවුරු වන ග්‍රාම නිලධාරී සහතිකය සමඟ විවාහ සහතිකය ඉදිරිපත් කළ යුතුය.)
V. **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය.
VI. **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද** අ.පො.ස. (උසස් පෙළ) සහතිකය.

VII. 2023.11.13 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් (දේශීය/විදේශීය) විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමෙන ආයතනයකින් ලබා ඇති උපාධි සහතිකය.
පෞද්ගලික (දේශීය/විදේශීය) විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා ඇත්නම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම විශ්වවිද්‍යාලය හා උපාධි පාඨමාලාව පිළිගෙන ඇති බව සනාථ කරන ලිපිය.

VIII. ලබා ඇති උපාධියට අදාළ ප්‍රතිඵල ලේඛනය (Detail Certificate / Academic Transcript).

IX. නම් වෙනසක් ඇතොත් ඒ බව තහවුරු කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.

**වැදගත් : අංක I සිට IX දක්වා ඇති සහතිකපත්වල ඡායා පිටපත් ලිපිගොනු කවරයක (File Cover) නොගැලවෙන සේ අමුණා (දිවුරුම් ප්‍රකාශයේ සහ ග්‍රා.නි. සහතිකයේ පමණක් මුල් පිටපත අමුණන්න) එම ලිපිගොනු කවරයේ ඉදිරිපස ඔබගේ නම සහ සම්මුඛ පරීක්ෂණ අංකය නිවැරදිව සඳහන් කර රැගෙන ආ යුතුය. තවද, ඉහතින් සඳහන් කරන ලද සහතික හැර වෙනත් සහතික හෝ ලිපිලේඛන කිසිවක් මෙම ලිපිගොනුවට ඇතුළත් නොකළ යුතුය. ඉහත දක්වා ඇති සියළුම ලේඛන සුදුසුකම් පරීක්ෂා කරන දිනයේම ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන භාර ගනු නොලැබේ.**

04. සම්මුඛ පරීක්ෂණයේදී අදාල සියළු සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සබරගමුව පළාත තුළ පුරප්පාඩු පවතින ඕනෑම පාසලක සේවය කිරීමට එකඟ වන බවට, මේ සමඟ අමුණා ඇති දිවුරුම් ප්‍රකාශය මගින් සහතික කර, එය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

05. නියමිත දිනයේදී සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවන අයදුම්කරුවන් සම්බන්ධයෙන් වෙනත් දිනයක් ලබා නොදෙන බැවින්, ඒ පිළිබඳව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

06. ගුරු ආචාරධර්මවලට අනුව, සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේදී, කාන්තා පාර්ශවය සුදු හෝ ලා පැහැති සාරියක්/ඔසරියකින්ද පිරිමි පාර්ශවය කලිසම හා කමිසය හෝ ජාතික ඇඳුමින් සැරසී පැමිණිය යුතුය.

07. මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පමණක්, කිසිසේත්ම ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත්වීමක් ලැබීම සඳහා සුදුසුකමක් නොවන බව කාරුණිකව අවධාරණය කරමි.

**බී.ඒ.සී.පී. බමුණුආරච්චි**
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.